ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## වෙළෙඳ, වාණිජ, **ආහාර** සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ මහතා ඉන්දීය සංචාරයක නිරත වේ (2025 සැප්තැම්බර් 24-26)

ශ්‍රී ලංකාවේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ මහතා සහ එම අමාත්‍යාංශයේ ලේකම් කේ. ඒ. විමලනේතිරාරාජා මහතා 2025 සැප්තැම්බර් 24-26 දිනවල නව දිල්ලියේ සංචාරයක නිරත විය. එම දෙපළ වර්ල්ඩ් ෆුඩ් ඉන්දියා ප්‍රදර්ශනය සඳහා ද සහභාගී විය.

2. අමාත්‍ය වසන්ත සමරසිංහ මහතා සිය සංචාරය අතරතුර දී ඉන්දියාවේ ආහාර සැකසුම් කර්මාන්ත අමාත්‍ය ශ්‍රී චිරාග් පස්වාන් මහතා සහ සමුපකාර රාජ්‍ය අමාත්‍ය මුර්ලිදර් මොහොල් මහතා හමු විය. එහිදී ආහාර සුරක්ෂිතතාවය, සමුපකාර සංවර්ධනය සහ ධාරිතා ගොඩනැගීම යන ක්ෂේත්‍ර තුළ ද්විපාර්ශ්වික සහයෝගීතාවය ශක්තිමත් කිරීම සහ අන්‍යොන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන අනෙකුත් ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය වැඩිදියුණු කළ හැකි ආකාර සාකච්ඡා කරන ලදී.

3. සංචාරය අතරතුර අමාත්‍ය වසන්ත සමරසිංහ මහතා “ආහාර පද්ධති පරිවර්තනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස ආහාර අහිමි වීම සහ නාස්තිය” යන තේමාවෙන් යුත් සැසියක් ද ඇමතු අතර එහිදී එතුමා ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දෘෂ්ටිකෝණයන් බෙදා ගත්තේය. එතුමා ආහාර නාස්තිය, තිරසාරත්වය සහ ආහාර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව යනාදි අභියෝගයන්ට මුහුණ දීමෙහි ලා සහයෝගී ප්‍රවේශයන්ගේ වැදගත්කම ද අවධාරණය කළේය.

4. මෙයට අමතරව, අමාත්‍යතුමා නැෂනල් කෝපරේටිව් එක්ස්පෝට් ලිමිටඩ් (NCEL) සහ නැෂනල් ඇග්‍රිකල්චරල් කෝපරේටිව් මාකටින් ෆෙඩරේෂන් ඔෆ් ඉන්ඩියා ලිමිටඩ් (NAFED) හි කළමනාකාර අධ්‍යක්ෂවරුන් ද හමු විය. එහිදී කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනයට සහ අලෙවිකරණයට පවතින අවස්ථා, ධාරිතා ගොඩනැගීම සහ සමුපකාර

ආකෘතිය තුළ මනා පිළිවෙතේ බදො හදා ගැනීම, සැපයුම් දාම කළමනාකරණය සහ භාණ්ඩ වෙළෙඳාම යනාදිය සම්බන්ධයෙන් පවතින අවස්ථා පිළිබඳව සාකච්ඡා කරන ලදී.

5. අමාත්‍යතුමා CII සහ PHDCCI විසින් සංවිධානය කරන ලද හමුවලදී කෘෂි ව්‍යාපාර සහ ආහාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ ද අන්තර්ක්‍රියා කරන ලදී. එතුමා වර්ල්ඩ් ෆුඩ් ඉන්දියා - 2025 ප්‍රදර්ශනයට සහභාගී වන කර්මාන්ත නියෝජිතයන් සමඟ ද විවිධ නියැලීම්වල නිරත විය. මෙම ප්‍රදර්ශනය හවුල්කාරිත්වයන් සහ ආයෝජන අවස්ථාවන් ගවේෂණය කිරීමට මෙන්ම ආහාර සැකසුම්, කෘෂිකර්මාන්තය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි තාක්ෂණ නුවමාරු සඳහා මාහැඟි වේදිකාවක් විය.

6. මෙම සංචාරය ආර්ථික සහයෝගීතාවය ශක්තිමත් කිරීමට සහ ආහාර සුරක්ෂිතතාවය සහ සමූපකාර සංවර්ධනය යන ක්ෂේත්‍ර තුළ නව අවස්ථාවන් ගවේෂණය කිරීමට දරෙටහේ පොදු කැපවීම අවධාරණය කරන ලදී.

***

**කොළඹ**

***2025* සැප්තැම්බර් *29***